බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
மேல் மாகாண ஆளுநர் பணிமனை

**SECRETARIAT OF THE GOVERNOR - WESTERN PROVINCE**

“ ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක්

ඔබේ අංකය. / உமது இல. / Your Ref. 1/4/2/5/144
මගේ අංකය / எனது இல. / My Ref. GOS/ADM/4/7/178
දිනය / திகதி / Date 2017.03. 15

27 MAR 2017
Provincial Public Service Comm...

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
109, මහ විදිය
බත්තරමුල්ල,

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය</u>

උක්ත මැයෙන් යුතු ඔබේ සමාංක හා 2017.03.15 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය 2017.03.15 දාතමින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

අනුමත කරන ලද අදාළ පරිපාටියේ පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

අ.කළේ/ පී.සෝමසිරි
බ.ප .ආණ්ඩුකාර ලේකම්

ජේ.සී.ජයලාල්
සහකාර ලේකම්(වැ.බ)

පිටපත් : 1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප) } අනුමත කරන ලද යථෝක්ත පරිපාටියේ පිටපතක් මේ සමග ඔබවෙත එවමි.


* පිළිතුරු සැපයීමේදී යොමු අංකය හා දිනය යෙදීමට කාරුණික වන්න. / பதில் அனுப்பும் போது தயவுசெய்து இலக்கத்தையும், திகதியையும் குறிப்பிடவும் / Please indicate my reference in the reply

| ලිපිනය / முகவரி Address | 109,. 5 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.<br>109, 5ம் மாடி, ரொட்டுண்டா கோபுரம், காலி வீதி, கொழும்பு - 03<br>**109, 5th Floor, Rotunda Tower, Galle Road, Colombo 03** | | | |
|---|---|---|---|---|
| | ආණ්ඩුකාර ලේකම් /ஆளுநரின் செயலாளர் Secretary to the Governor | සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administartive Officer | කාර්යාලය / அலுவலகம் / Office |
| දුරකථන / தொலைபேசி / Telephone | 0112334097 | 0112334737 | 011 3159587 | 0112334347 / 0112334348 |
| ෆැක්ස්/ பெக்ஸ் / Fax | 0112334098 | 0112334738 | | |
| විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | secretary@governor.wp.gov.lk | as@governor.wp.gov.lk | ao@governor.wp.gov.lk | cma@governor.wp.gov.lk<br>info@govsec.wpc.gov.lk |

**"බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඉඩම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය"**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
යොමු අංකය:පළාත්/ඉකො/ප්‍රකස/ආ1/2/7 දිනය : 2017.02. 15

1.2 අමාත්‍යාංශය : බස්නාහිර පළාත් ඉඩම් අමාත්‍යාංශය
යොමු අංකය : කාං/ආණ/x/1/16 දිනය : 2017. 02. 22

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම:
යොමු අංකය:ඩීඑම්එස්/ඩී/ පොදු 11-2 දිනය : 2012.12.19

1.4 බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් නිර්දේශය යොමු අංකය: CSO/PTR/12/2/2 දිනය : 2017. 03. 07

1.5 වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය යොමු අංකය : දිනය :

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය යොමු අංකය : 1/4/2/5/144 දිනය : 2017. 03. 15

1.7 බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය
යොමු අංකය : දිනය :

02. පත් කිරීමේ බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ක්‍රියාත්මක වන දිනය : බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : 111,11,1

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය :

බස්නාහිර පළාත තුළ ඇති රජයේ ඉඩම් කළමනාකරණය කිරීමේ කාර්යභාරයට අදාල වන අධීක්ෂණය, සම්බන්ධීකරණය, පුහුණු හා උපදේශාත්මක සේවා සැපයීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැනි කාර්යයන්ගෙන් සමන්විත කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. දිනය 2017/03/15
යොමු අංකය : ගෝ/ආ/ප/4/7/178

04.තනතුරේ ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05.වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL-1- 2016

5.2 වැටුප් පරිමාණය : රු. 47615 - 10 x 1335 - 8 x 1630 – 17 x 2170 - 110895

5.3 **ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර**

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය(රු) |
|---|---|---|
| 111 | පියවර 01 | 47615/- |
| 11 | පියවර 12 | 62595/- |
| 1 | පියවර 20 | 76175/- |

සටහන :- බඳවා ගැනීම් හා උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කල යුතුය.එහෙත් ගෙවීම් සිදුකල යුත්තේ උපලේඛන 11 හි සඳහන් පරිදි බැව් අදාල පත්වීම් ලිපියේ සඳහන් කල යුතුය.

**06.සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

6.1 **අනුමත තනතුරු නාම,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්**

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | 111 | 01 | 1.රජයේ ඉඩම් බෙදා දීමේ කටයුතු සම්බන්ධීකරණය.<br>2.අනවසර ඉඩම් නියමානුකුල කිරීම සඳහා නිර්දේශ ලබාදීම.<br>3.දීමනා පත්‍ර පසු කටයුතු සම්බන්ධීකරණය කිරීම.<br>4.පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම හා උපදේශක සේවා පැවැත්වීම.<br>5.පළාත් සභාවට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>6.ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

සටහන :- ශ්‍රේණිගත උසස් කිරීමේ කාර්ය සඳහා 111,11 හා 1 ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් ලෙස සැලකේ



විසින් අනුමත කරන ලදී
දිනය :....12/03/15
යොමු අංකය :................

07.බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම - අදාල නොවේ

7.3 සීමිත බඳවා ගැනීම - අදාල නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 111 වන ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : ජනපද නිලධාරි තනතුරට බඳවා ගන්නා අවස්ථාවේදී ලබාගත යුතුව තිබූ අවම අධ්‍යාපන සුදුසුකම සපුරා තිබීම ප්‍රමාණවත් වේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : විශේෂ පන්තියේ ජනපද නිලධාරි තනතුර දරන්නෙකු වීම, ජනපද නිලධාරි විශේෂ පන්තියේ සේවා කාලය තුල සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම **සහ පූර්වාසන්න වසර පහ (05) තුල සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.**

7.4.2.3 පළපුරුද්ද : අදාල නොවේ

7.4.2.4 කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටුකිරිමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් : නැත

7.4.3 වයස

7.4.3.1 අවම සීමාව : අදාල නොවේ

7.4.3.2 උපරිම සීමාව : අදාල නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ........................ දිනය : ..........

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.4.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සිදුකරනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ

7.4.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා - අදාල නොවේ

7.4.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන ආකාරය (ඇමුණුම - 1)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය | 50 | අදාල නොවේ |
| කුසලතාවය | 50 | |

සටහන - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව මත පත්කිරීම් කරනු ඇත.

7.4.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5 අයදුම්පත් කැදවීමේ ක්‍රමය : අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව

**08.කාර්යක්ෂමතා කඩඉම්**

**8.1**

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | 111 වන ශ්‍රේණියට පත් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය විෂය නිර්දේශය ඇමුණුම (2) |
| 11 වන කාර්යක්ෂමතා කඩඉම | 11 වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය විෂය නිර්දේශය ඇමුණුම (3) |
| 111 වන කාර්යක්ෂමතා කඩඉම | 1 වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය විෂය නිර්දේශය ඇමුණුම (4) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ? වර්ෂයකට එක් වරක් හෝ අවශ්‍යතාවය පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන බලධාරීන් කවුරුන්ද ?

1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
11 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
111 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

} බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය ................ දිනය ...24.12.2015
G03/ADM/9/7/178

09. භාෂා ප්‍රවීනතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| 1.රාජ්‍ය භාෂාව | අදාල නොවේ |
| 2.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ ප්‍රවීනතාවය ලබාගත යුතුය. |
| 3.සන්ධාන භාෂාව | පත්වීම් දින සිට වසර හය (06) ක් ඇතුලත සන්ධාන භාෂාව පිළිබඳ විභාගයෙන් සමත් විය යුතුය. සිංහළ හෝ දෙමළ භාෂා මාධ්‍යයෙන් ඇතුළත් වූ නිලධාරීන් සඳහා සන්ධාන භාෂාව ඉංග්‍රීසි වේ. |

සටහන - අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව විෂයය සමත් වී ඇති නිලධාරීන් සන්ධාන භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

10.ශ්‍රේණි උසස් කිරීම

කාර්ය සාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ උසස්කිරීම් ක්‍රමයකින් සමන්විත වේ

10.1 111 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ 111 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම
III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම
VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම
VII. සන්ධාන භාෂාව නියමිත දිනට සමත් වී තිබීම

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 11 ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 11 වන ශ්‍රේණියේ සිට 1 වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දින 2012/03/15
ගොනු අංකය :
603/KDM/4/P/178

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම

II. නිලධර ගණයේ 11 ශ්‍රේණියේ වසර හතක (07) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හතක (07) ක් උපයාගෙන තිබීම

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

IV. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) ක සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම

V. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 1 වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම : අදාල නොවේ

11.තනතුරු වලට පත් කිරීම : අදාල නොවේ

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද අනුව කටයුතු කල යුතුය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :................ දිනය :......12/03/15
ගො9/ADM/4/7/198

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන අවස්ථාවේ සේවයේ නියුක්තව සිටින නිලධාරියා / නිලධාරිණිය සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරේ 111 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15.මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටලු පැන නගින අවස්ථාවකදී හා / හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

16. <u>අර්ථ නිරූපන</u>

සතුටුදායක සේවා කාලය

1.පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද, පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුලදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

11. සේවකයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩුකොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ, වැරදි පිළිබද පළමු වැනි උප ලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක්ද සහ ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ, වැරදි පිළිබද දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

සක්‍රිය සේවා කාලය

ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ.රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලැබේ.

නියමිත දිනට

අදාල කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය, නියමිත දිනය ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත.නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සකස් කළේ : අත්සන [signature]

පරීක්ෂා කළේ : අත්සන [signature]

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර : යූ. ඒ. එස්. එච්. සිසිර කුමාර
නිලමුද්‍රාව පළාත් ඉඩම් කොමසාරිස් (බ. ප.)
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.)
මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2017.02. 15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. (7)
ගොනු අංකය :......... දිනය :.........
GS/ADM/4/7/128

යොමු අංකය : කෘ/ඉ/ම IX/1/16

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි සහකාර පළාත් ඉඩම් කොමසාරිස්(දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

එන්. නිල්වල
ලේකම්
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ
ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බස්නාහිර පළාත)
ශ්‍රාවස්ති මන්දිරය,
තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

අත්සන :
නම :
ලේකම්,
කෘෂිකර්ම,ඉඩම්,වාරිමාර්ග,සත්ත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ
අමාත්‍යාංශය(බප)
නිලමුද්‍රාව

දිනය : 2017.02. 22

යොමු අංකය : CSD/PTM/12/2/2/2

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි සහකාර පළාත් ඉඩම් කොමසාරිස්(දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :
නම :
ප්‍රධාන ලේකම් (බ.ප)
නිලමුද්‍රාව

දිනය : 2017. 03. 07

එම්.ජී.බී. දයා සෙනරත්
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය : 1/4/2/5/144

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි සහකාර පළාත් ඉඩම් කොමසාරිස්(දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

අත්සන :
නම :
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)
නිලමුද්‍රාව

දිනය : 2017. 03. 15

එම්. සී. ඒ. තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය :.. 2017/03/15
යොමු අංකය :..............
ආලේ/ආ/4/2/128

යොමු අංකය : 6-5/AD4/1/7/178

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි සහකාර පළාත් ඉඩම් කොමසාරිස්(දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2017/03/15..... දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම :

ආණ්ඩුකාර ලේකම් (බස්නාහිර පළාත)

නිලමුද්‍රාව

ඛ.ප. ආණ්ඩුකාර ලේකම්
ඛ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
05 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල,
අංක 109, ගාලු පාර, කොළඹ 03.

දිනය : 2017. 03. 15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය :.................. දිනය :..2017.03.15
6-5/AD4/1/7/178

ඇමුණුම 01

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට අදාල ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>

01. පරීක්ෂණයේ නම :බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට අදාල ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය<br>ජනපද නිලධාරි විශේෂ ශ්‍රේණියේ සේවය කර ඇති වසරක් සඳහා ලකුණු 05 බැගින් | 50 | 50 | අදාල නොවේ |
| කුසලතාවය<br>1. කාර්ය සාධනය - ආසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් සඳහා වසරකට ලකුණු 02 බැගින් | 10 | 50 | |
| 2. රැකියා ක්ෂේත්‍රයට අදාල පුහුණුවීම් සඳහා සහභාගි වීම. එක් පුහුණු පාඨමාලාවකට ලකුණු 02 බැගින් | 10 | | |
| 3. රැකියා විස්තරයේ ඇතුලත් කරුණු සම්බන්ධ අවබෝධය<br>i. රජයේ ඉඩම් බෙදාදීමේ කටයුතු සම්බන්ධීකරණය<br>ii. අනවසර ඉඩම් නියමානුකූල කිරීම සඳහා නිර්දේශ ලබාගැනීම<br>iii. දීමනා පත්‍ර පසු කටයුතු සම්බන්ධීකරණය<br>iv. පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම හා උපදේශක සේවා සැපයීම<br>v. පළාත් සභාවට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br>vi. ක්ෂේත්‍ර නිලධාරින්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය | 30 | | |

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
අදාල නොවේ

සකස් කලේ : අත්සන
විෂය භාර නිලධාරියා
නම : ඒ.එල්.පාලිත
තනතුර : කළමනාකරණ සහකාර
දිනය : 2017.02.14

පරීක්ෂා කලේ : අත්සන
විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා
නම : ඩී.එම්.එස්.තිලකරත්න
තනතුර :සහකාර පළාත් ඉඩම් කොමසාරිස්
දිනය :2017.02.15

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : යූ.ඒ.එස්.හර්ෂප්‍රිය සිසිර කුමාර
තනතුර : පළාත් ඉඩම් කොමසාරිස්
දිනය : 2017.02. 15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :.................. දිනය :...2017/02/23
GGS/ADM/4/7/878

යූ. ඒ. එස්. එච්. සිසිර කුමාර (10)
පළාත් ඉඩම් කොමසාරිස් (බ. ප.)
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.)
මාලිගාවත්ත - කොළඹ 10.

ඇමුණුම 02

<u>**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට අදාල පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**</u>

01.විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තු ගත) තනතුරට අදාල 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02.විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| 2. බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති | පැය 02 | 100 | 40% |
| 3. ඉංග්‍රීසි | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වතාවක් හෝ අවශ්‍යතාවය පරිදි.

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය | ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද<br><br>VII වැටුප්<br>IX ගාස්තු<br>XII නිවාඩු<br>XIII දුම්රිය බලපත්‍ර<br>XVII අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර<br>XXV වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ<br>XXVI නිලධරයන්ගේ කායික යෝග්‍යතාව පිළිබඳ වෛද්‍ය පරීක්ෂණය සහ වෛද්‍ය උපචාරය<br>XXVII ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXVIII පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXIX ඉඩම් අත්කර ගැනීම, ආයෝජන හා උකස්<br>XXX රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXXI සමිති සමාගම් පවත්වාගෙන යාමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XLVII සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>සහ<br><br>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය |

[illegible] ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :................ දිනය :...2012/3/16
[illegible]/4/7/178

| | |
|---|---|
| 2. බස්නාහිර පළාත් සභා. මූල්‍ය රීති | 1 වන පරිච්ඡේදය - බස්නාහිර පළාත් සභා අරමුදල,වාර්ෂික ඇස්තමේන්තු (රීති 1 සිට 38) දක්වා<br><br>11 වන පරිච්ඡේදය - වොරන්ට් බලපත්‍ර හා අග්‍රිම අධිකාරි බලය,පාඩු හා අත්හැර දැමීම (රීති 43 සිට 64 ) දක්වා<br><br>VI වන පරිච්ඡේදය - පළාත් සභාවේ මුදල් භාරකාරත්වය හා ආරක්ෂාව,උප පත්‍රිකා පොත්,මුදල්,මුද්දර යනාදිය පිළිබද සමීක්ෂණ මණ්ඩල,අග්‍රිම,බැංකු ගිණුම් (රීති 215 සිට 268 ) දක්වා<br><br>X වන පරිච්ඡේදය - ප්‍රසම්පාදන,බැහැර කිරීම් හා කුලියට දීම් ලේඛන යනාදිය,සැපයුම්,භාණ්ඩ වල භාරය සහ හරි වැරදි බැලීම,වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ (රීති 418 සිට 490 ) දක්වා |
| 3.ඉංග්‍රීසි | 1.English Grammar<br>2.Writing Skills<br>3.Reading Skills |

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර : යූ. ඒ. එස්. එච්. සිසිර කුමාර
නිලමුද්‍රාව පළාත් ඉඩම් කොමසාරිස් (හා. ක.)
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.)
මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2017.02. 15

භාර ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය :.......
ගොනු අංකය :.................

## ඇමුණුම 3

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට අදාල දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.</u>**

01.විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තු ගත) තනතුරට අදාල දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02.විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.ඉඩම් ප්‍රතිපත්ති, නීති හා රෙගුලාසි | පැය 02 | 100 | 40% |
| 2.ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වතාවක් හෝ අවශ්‍යතාවය පරිදි.

05. භාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| **ඉඩම් ප්‍රතිපත්ති, නීති හා රෙගුලාසි** | 1.ඉඩම් සංවර්ධන ආඥා පනත<br>2.රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීම) පනත<br>3.රජයේ ඉඩම් ආඥා පනත<br>4.ඉඩම් අත්කර ගැනීමේ පනත<br>5.ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත<br>6.ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත<br>7.වාරිමාර්ග ආඥා පනත<br>8.කැලෑ ආඥා පනත<br>9.මධ්‍යම පරිසර අධිකාරිය පනත<br>10.හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත<br>11.ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීම<br>12.ඉඩම් කොමසාරිස් ආඥා පනත |
| ජනාවාස සැළසුම්කරණය හා කළමනාකරණය | 1.ඉඩම් පරිහරණ සැලසුම් භාවිතය<br>2.විවිධ සිතියම්, පිඹුරුපත් හා ඒවායේ භාවිතය<br>3.ජනාවාස සැලසුම් කිරීම සහ කළමනාකරණය පිළිබඳ මූලිකාංග<br>4.සමාජ ආර්ථික සමීක්ෂණ<br>5.ජල පාලනය<br>6.ලෝක ආහාර වැඩ සටහන |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :................ දිනය :......

| | |
|---|---|
| | 7.පස සංරක්ෂණය<br>8.බෝග විවිධාංගිකරණය<br>9.ප්‍රජා සංවර්ධනය<br>10.ආයතනික සංවර්ධන සමාලෝචනය හා ඇගයීම |

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර : යූ. ඒ. එස්. එච්. සිසිර කුමාර
නිලමුද්‍රාව පළාත් ඉඩම් කොමසාරිස් (ස. ප.)
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.)
මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2017.02. 15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :................. දිනය :......2017/02/15
GS/ASM/4/7/176

## ඇමුණුම 4

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට අදාල තුන් වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**

01. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තු ගත) තනතුරට අදාල තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| රජයේ ඉඩම් කළමනාකරණය | 100% | 40% |

03. පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වතාවක් හෝ අවශ්‍යතාවය පරිදි.

05. විභාගය සදහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| රජයේ ඉඩම් කළමනාකරණයට අදාලව වචන 1500 කට නොඅඩු වචන සංඛ්‍යාවකින් යුතු නිබන්ධනයක් ඉදිරිපත් කිරීම | රජයේ ඉඩම් බෙදාදීම<br>අනවසර ඉඩම් නියමානුකූල කිරීම<br>දීමනාපත්‍ර පසු කටයුතු<br>උපදේශන සේවා |

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර : යූ. ඒ. එස්. එච්. සිසිර කුමාර
පළාත් ඉඩම් කොමසාරිස් (බ. ප.)
නිලමුද්‍රාව : පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.)
මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2017.02. 15

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :................ දිනය : 2017/03/15
Gov/AD 4/4/7/174